# සීමා නිර්ණයට විරුද්ධව ගොනු කළ පෙත්සම විභාග කළත් මුළු ඡන්දයම කල් දැමිය යුතු නැහැ

ලක්බිම 2017 නොවැම්බර් 22 බදාදා

## - පැෆරල් විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

තනුජා නානායක්කාර

**පළාත්** පාලන මැතිවරණය සම්බන්ධව අභියාචනාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීම හේතුවෙන් සමස්ථ ඡන්දයම කල් දැමිය යුතු නැතැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

ඒ මහතා මෙසේ පැවැසුවේ ඊයේ (21) මරදාන සමාජීය හා සාමයික කේන්ද්‍රයේ පැවැති මාධ්‍ය හමුවකදීය. හෙතෙම වැඩිදුර-ටත් මෙසේද පැවැසීය. වසර දෙක හමාරකට වැඩි කාලයක් පළාත් පාලන මැතිවරණය කල් ගිහින් තිබෙනවා. මඩකලපුවේ ජනතාව අවසන් වරට පළාත් පාලන ඡන්දය පාවිච්චි කරලා තියෙන්නේ 2008 අවුරුද්දේ. පුදුකුඩුඉරිප්පු තියන මුහුදුබඩ පත්තු ජනතාව අවසන් වරට ඡන්දය පාවිච්චි කරලා තියෙන්නේ 1970 අවුරුද්දේදී මේ ජනතාවට අවුරුදු හතළිහකින් ඡන්දය පාවිච්චි කරන්න අවස්ථාව ලැබී නැහැ.



මාධ්‍ය හමුවේදී පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා අදහස් දැක්වූ අයුරු. ඡායාරූපය - තුෂාර අතපත්තු

මෙවර පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට තීරණය කර තිබියදී අශෝක පීරිස් කමිටුව ඔවුන්ගේ බලය ඉක්මවා පාවිච්චි කරලා ඇතැයි පවසමින් පුද්ගලයින් හය දෙනකු අභියාචනාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කර තිබෙනවා. මේ පෙත්සමට අනුව මෙම ගැටලුව තිබෙන්නේ බහු ආසන තිබෙන ප්‍රදේශවලට පමණයි. අධිකරණය මේ නඩුව දිගටම විභාග කරනවා නම් පළාත් පාලන ආයතනවලින් සියයට පනහකට වැඩි මේ නඩුවට අදාළ නැති ප්‍රදේශ තුළ ඡන්දය පැවැත්විය හැකියි. ඒ වෙනුවෙන් අධිකරණයට කරුණු දක්වන්න අපි ඉදිරිපත් වෙනවා. එමෙන්ම යම් දේශපාලන පක්ෂයක් දූෂිත පුද්ගලයන් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් කළොත් රටේ ජනතාවට එම පුද්ගලයන් හෙළිදරව් කරන්නත් අපි කටයුතු කරනවා යැයි පැවැසීය.

කැෆේ සංවිධානය නියෝජනය කරමින් අදහස් දැක්වූ රංජිත් කීර්ති තෙන්නකෝන්, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය නියෝජනය කරමින් මංජුල ගජනායක සහ ජාතික මැතිවරණ නිරීක්ෂණ ආයතනය නියෝජනය කරමින් රොහාංග හරිස්චන්ද්‍ර යන මහත්වරු මෙම මාධ්‍ය සාකච්ඡාවේදී අදහස් දැක්වූහ.